# දේශමාන්‍ය, දේශබන්ධු, දේශාභිමාණි, ලංකාපුත්‍ර, ශාසනාභිවෘද්ධි ධර්මචාරී, මීගොමු පුත්‍ර කීර්තිරත්න, ශ්‍රී ලංකා ව්‍යාපාර විභූෂණ, සමාජ සේවා විශාරද සාමවිනිසුරු ඩී. එස්. ද සිල්වා මැතිතුමා

මිනුවන්ගොඩ උන්නාරුව නම් ග්‍රාමයේ සංචාරක ව්‍යාපාරිකයෙකු ලෙසින් ජීවන මංතලාවේ සැරිසැරූ දිනයාදුර බෙන්ජමින් ඇල්ප්‍රඩ් ද සිල්වා සහ මනික්කුගේ ආරියවතී ද සිල්වා දම්පතීන්ගේ දෙටු පුතණුවන් ලෙසින් හිරු උදාවූ තවත් පිංබර දිනයකදී දිනයාදුර සෝමචන්ද්‍රන් ද සිල්වා නම් පිංවත් කුමරු මීගමුවේදී මෙලොව එළිය දුටුවේය. ඒ 1952 දෙසැම්බර් 06 වෙනිදාය.

සොහොයුරන් දෙදෙනකුගේ සහ සොහොයුරියන් තිදෙනෙකුගේ වැඩිමහල් සොහොයුරා ලෙසින් ආදර්ශමත්ව සෙනෙහසින් කල් යැවූ මේ කුමරු මූලික අධ්‍යාපනය මීනු / පීල්ලවත්ත කනිෂ්ඨ විද්‍යාලයෙන් ලැබූ අතර අනතුරුව මීනු/ හීනටියන ධම්මාලෝක මධ්‍ය මහා විද්‍යාලයට ඇතුලත් වී 1968 දෙසැම්බර් මස පවත්වන ලද අ.පො.ස. (සාමන්‍ය පෙළ) විභාගය නිමකිරීමෙන් පසු දින පටන්ම පියාගේ අඩිපාරේ යමින් පියාගේ ව්‍යාපාර කටයුතු වලට සහයෝගය දක්වමින් 1978 වසර දක්වාම වසර දහයක කාලයක් පුරා ලබාගත්තා වූ කටුක වූත්, දුෂ්කර වූත්, අම්හිරිවූත් අත්දැකීම් ජීවිතයට ආශිර්වාදයක් සේ සලකමින් වඩාත් විමසිලිමත්ව නිසි අයුරින් තම වගකීම් හා යුතුකම් ඉටුකරන ලදී.

මේ වන විට යෞවනයට එළඹ සිටි සෝමචන්ද්‍ර සිල්වා කුමරුවන් හීනටියන පදිංචිව සිටි කේ. ඔලිවර් ද සිල්වා සහ වයි. එව්ජින් ද සිල්වා දම්පතීන්ගේ දයාබර දියණිය වූ කුරුවිකාර සුදර්මා කාන්ති ද සිල්වා වික්‍රමසිංහ කුල කුමරිය හා 1979 අගෝස්තු 20 වැනි දින යුග දිවියට පිවිසුණේය.

ඒදින තම පියාණන් විසින් පිරිනමන ලද 24 ශ්‍රී 6830 දරණ B. M. C. ලොරියත් මුදලින් රු.6000/- ක් වූ මුදලක් පමණක් අතැතිව ව්‍යාපාර ලෝකයට තනිවම පියවර තැබූ මේ දිරිය යෞවනයා 1979-1983 දක්වා වූ කාලය තුල මිනුවන්ගොඩ උන්නාරුව සිට පොල් හා අන්නාසි යාපනයට ප්‍රවාහනය කල අතර යාපනයේ සිට මීගමුවට කරවල, මිරිස් හා එළුණු ප්‍රවාහනය කරන ලදී.

1980 ජූලි මස 02 වැනිදා මෙම යුවලට උතුම් වූ මව් පදවියත්, උතුම් වූ පිය පදවියත් , උරුමකර දෙමින් කුලුඳුල් පුතණුවන් ලෙසින් දිනයාදුර චානුක රොෂාන් සෝමචන්ද්‍ර ද සිල්වා නම් පිංවත් කුමරා මෙලොවට බිහි වූ අතර, එම පුතණුවන් තම ජීවිතයේදී ලබාගත් උතුම්ම තිළිණයකි. පියෙකු සතු වගකීම මනාව වටහා ගනිමින් තම පුතුව මූලික අධ්‍යාපනය සඳහා මීගමුව හරිශ්චන්ද්‍ර ජාතික පාසැලට ඇතුලත් කල අතර උසස් අධ්‍යාපනය සඳහා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියට ඇතුලත් කර එහිදී එම පුතණුවන් ව්‍යාපාර කළමනාකාර උපාධිය ලබාගත් අතර ඔහු මේ වන විට කැල්ටන් සමූහ ව්‍යාපාරයේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකු ලෙෂ කටයුතු කරනු ලැබේ.

තවද 1983 සැප්තැම්බර් 24 වැනිදා ද මෙම යුවලට තවත් වාසනාවන්ත දවසක් විය. ඒ ඔවුන්ගේ මද්දුම පුතණුවන් ලෙසින් දිනයාදුර චතුර ප්‍රසාන් සෝමචන්ද්‍ර ද සිල්වා උපත ලැබූ බැවිනි. එම පුතුද මූලික අධ්‍යාපනය මීගමුව හරිශ්චන්ද්‍ර ජාතික පාසැලෙන් නිම කිරීමෙන් පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා නවසිලන්තයේ ලින්කන් සරසවියට ඇතුලත් වී අහාර සහ වාණිජ පිළිබඳ උපාධිය හදාරමින් සිටී.

මෙම දෙපලට බාල පුතු වන දිනයාදුර මහේෂ් නිසාන් සෝමචන්ද්‍ර ද සිල්වා තිළිණ කරමින් තවත් ලස්සන දවසක් උදාවුයේ 1985 අගෝසතු මස 22 වැනිදාය. මේ පුතු ද මූලික අධ්‍යාපනය මීගමුව හරිශ්චන්ද්‍ර ජාතික පාසැලෙන් නිම කිරීමෙන් අනතුරුව වැඩිදුර අධ්‍යා-පනය සඳහා නවසිලන්තයේ කැන්ටබරි සරසවියෙන් ඉංජිනේරු උපාධිය හදාරමින් සිටී.

මේ අයුරින් පිය පදවියේ ගෞරවය මනාව රැක ගනිමින් තම යුතුකම් හා වගකීම් මනාව ඉටුකරමින් දැයට ඵලදායී පුරවැසියන් තිදෙනකු ද බිහි කල මෙතුමා ළමාවියේ සිටම ව්‍යාපාරයන් පිළිබඳ ලද අත්දැකීම් තුලින් ලැබූ පන්නරයෙන් වර්ෂ 1983 දී සේවක සංඛ්‍යාව හතර දෙනෙකුගෙන් ඇරඹි “කැල්ටන් ස්ටෝර්ස්” නම් වූ තම ව්‍යාපාරය මීගමුව නගරයට හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපාරය තුලින් පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලීමට නිබඳවම කැපවෙමින් නිතිපතාම සෑම වෙළඳ සැලකටම ප්‍රථමයෙන් විවෘත කෙරෙන “කැල්ටන් ස්ටෝර්ස්” හි අලෙවි කටයුතු නිමා කරන්නේද නගරය තුල ඇති සෑම වෙළඳ සැලකම අලෙවි කටයුතු නිමා කිරීමෙන් පසුවය. එවැනි අයුරින් පාරිභෝගිකයාට පහසු අන්දමින් වැඩි කාලයක් විවෘත කිරීම තුලින් තමන්ට භාණ්ඩ ලබාගැනීමට අවස්ථාව සලසාදුන් අතර, පැමිණෙන සෑම පාරිභෝගිකයකුටම සිනාවෙන් සංග්‍රහ කිරීමත්, ගරුසරු ඇතිව කථාකිරීමත්, දවසේ අලෙවි කටයුතු නිමකර නිවසට යන මාර්ගයේ සිටින පාරිභෝගිකයන්ගේ ප්‍රවාහන වියදම් දරාගෙන රැගෙන යා යුතු භාණ්ඩ වෙළඳ සැලට හෝ නිවසට භාරදීමට පියවර ගැනීමත්, වෙළඳසැලට පැමිණි පසු ඉතාමත්ම කෙටිකාලයක් තුල සාධාරණ වූ මිලකට භාණ්ඩ ලබාදීමත්, පාරිභෝගික විශ්වාසයත්, දිනාගැනීමට ඉවහල්වූ කරුණු වූ බැවින් දිනෙන් දිනම මෙම වෙළඳසැලේ අලෙවි කටයුතු ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වාගෙන යන ලදී.

මේ වන විට මීගමුව නගරය වෙත නන්දෙසින් පැමිණෙන ජනතාවට ප්‍රණීත අහාරපාන ලබා ගැනීමට ස්ථානයක් තිබීම වඩාත් යෝග්‍ය බව වටහා ගැනීම නිසා 1990 වර්ෂයේදී සේවකයින් දොළොස්දෙනෙකු සමගින් තැටි පහළොවකින් දර පෝරණුවෙන් බේකරි නිෂ්පාදනයට අවතීර්ණ වූ අතර ඒකී ක්ෂේත්‍රය පිළිබඳව පළපුරුද්දක් හෝ දැනීමක් නොමැති බැවින් අදාල කාර්‍යන් පිළිබඳව පුහුණු හා ප්‍රවීණ සේවක-යින් හා එක්ව උරෙන් උර ගැටී සමගියෙන් දිවා රාත්‍රී අපමණ ලෙස වෙහෙසෙමින් ඒ පිළිබඳව මනා පළපුරුද්දක් ලබා ගන්නා ලදී.

මේ අන්දමින් ව්‍යාපාර ලොව විවිධ වූ අත්දැකීම් ජීවිතයට එකතු කර ගනිමින් ව්‍යාපාර ලෝකයේ දියුණුව කරාම පියවර තැබූ ඩී. ඇස්. ද සිල්වා මහතාණන් තම ව්‍යාපාරික දැනුමින් පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරන අතරවාරයේදී දයාබර බිරිඳ හා දරු තිදෙනාගේ ඇතුළුව සහෝදර, සහෝදරියන්ගේ හා නෑදෑ හිතවතුන්ගේ පවුල්වලද අභිවෘද්ධිය සලසන අතරම ව්‍යාපාරික කාර්‍යයන්ද මනාලෙස හසුරුවා ගනිමින් සමාජය හා එක්ව ක්‍රියාකරන්නා වූ මෙහෙයන් වෙනුවෙන් 1991 වර්ෂයේදී සමාදාන විනිසුරු තනතුරෙන් පිදුම් ලැබුවේය.

කාර්‍යශූරවූත්, බුද්ධිමත්වූත් , මෙතුමාගේ සාර්ථකත්වය දුටු පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ කාර්‍යයේ නියැලී සිටින ඔරියන්ට් ට්‍රේඩිං සමාගම ද , නෙස්ලේ ලංකා සමාගමද , කොකා කෝලා සමාගම ද , සී. පී. සී. ලංකා සමාගමද මීගමුව ප්‍රදේශයේ අලෙවි නියෝජිත ලෙස සෝමචන්ද්‍ර මැතිතුමන්ව පත් කර ගැණුනි.

මේ අයුරින් විවිධ පැතිකඩයන් ඔස්සේ ව්‍යාපාරික කටයුතු පුළුල් කරමින් ව්‍යාපාරික ලොව ජයගන්නට දැරූ උත්සහයේ මල්ඵල ගන්වමින් 1996 වර්ෂයේදී පැවති රජයෙන් පිරිනමන ලද බදු සහන මත සේවකයින් 54 දෙනෙකුව සේවයට යෙදවීමේ පදනම මත නවීන යන්ත්‍ර සූත්‍ර අධාරයෙන් ඉතාමත් පිරිසිදුව නැවුම් රසයෙන යුතුව පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට බේකරි නිෂ්පාදනාගාරය “කැල්ටන් ස්විට් ප්‍රයිවට් ලිමිටඩ්” නමින් කටුනායක නගර මධ්‍යයේ ආරම්භ කරන ලදී.

අනතුරුව වෙනත් ස්ථාන වලද ශාඛාවන් ඇති කරමින් “කැල්ටන්” නිෂ්පාදනාගාරයේ නැවුම් රසයෙන් යුතු ආහාරපාන වල රසවිඳීමට පාරිභෝගිකයන්ට අවස්ථාව සලසා දුනි.

බේකරි නිෂ්පාදන ආයතනය මනාව පවත්වගෙන යමින් විශාල රැකියා අවස්ථාවන් සලසා ගනිමින් සමාජයට ඉටුකරන්නාවූ මෙහෙවරත් සමඟ අලෙවි නියෝජිත ලෙසින් ද ක්ෂේත්‍රය තුල ලබාගන්නා වූ ජයග්‍රහණ පිළිබඳ විමසිල්ලෙන් සිටියාවූ විවිධ භාණ්ඩ බෙදා හැරීමේ ආයතන විසින් මීගමුවේ අලෙවි නියෝජිත ලෙස පත්කරගැනීමට සෝමචන්ද්‍ර මහතාව තෝරා ගත් අතර, මේ වන විට ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලන සීමාසහිත යුනිලීවර් ආයතනයේ මීගමුව අලෙවි නියෝජිත වශයෙන් පත්කර ඇත්තේද සෝමචන්ද්‍ර මැතිතුමාවය.

නිබඳවම ජනතාවට නවතාවයන් හඳුන්වා දෙන මෙතුමා නවීන මුහුණුවරකින් කැල්ටන් හයිපමාකට් ආයතනය 2007 වර්ෂයේදී ආරම්භ කරන ලදී. කොළඹ නගරයට පිවිසීමට ගතවන කාලයත් අපහසුතාවයත් පිළිබඳව සැලකිල්ලට ගෙන ගොඩනැගිලි සහ නිවාස සැලසුම් පිටපත් සහ මුද්‍රණය කරගැනීමේ කාර්‍යය මීගවුව හයිපමාකට් වෙතට පැමිණීමෙන් පහසුවෙන් සිදුකර ගතහැකි බැවින් මීගමුව නගරයටද අවට නගර වාසීන්ටද සිදුකර ඇත්තේ විශාල සේවාවකි.

එමෙන්ම කොළඹට පමණක් සීමා වී තිබූ ක්ලැඩිං ෂීට් පිට පළාත්වල පාරිභෝගිකයටද පහසුවෙන් හා ආකර්ෂණීය මිළ ගණන් යටත් අලෙවි කිරීම තුලින් ජනාතාවට සිදුවෙන්නාවූ සෙත පිළිබඳ විමසිලිමත් වෙමින් ජර්මන් තාක්ෂණයෙන් නිෂ්පාදිත P.V.D.F. ආලේපිත මිලිමීටර් 4 ඝනකමක් සහිත වසර 20 වගකීමක් සහිත විවිධ වූ වර්ණ වලින් ඇති ඇලූමිනියම් Q Bond ක්ලැඩිං තහඩු වලින් ගොඩනැගිලි පිටත අලංකාර කර ගැනීමේ කාර්‍ය මනාව සිදු කර ගත හැකි වනු ඇත. ගොඩනැගිල්ලකට තහඩු සවිකර අලංකාරව නිමකරදීමේ කාර්‍යයද මනාව සිදු කරන අතර ලංකාවේ අලෙවි වන ක්ලැඩිං ෂීට් අතරින් ඉදිරියෙන් තැබිව හැකි Q Bond ක්ලැඩිං ෂීට් භාවිතට ගැනීමෙන් ඕනෑම පැරණි ගොඩනැගිල්ලක් නවීන මුහුණුවරක් ගෙන දීමට සමත් වනු ඇත.

රටේ ඵලදායීතාවය ඉහල නැංවීමේ අරමුණින් කෘෂිකර්මාන්තයට නවෝදයක් එක්කරමින් C.C.M. ඇග්‍රෝ නමින් එළවළු හා පළතුරු වගාකිරීමේ සත්කාර්‍යයේ ද නියැලී සිටී.

ව්‍යාපාරික කාර්යයන් සඳහා පමණක්ම තම්දිවිය පුද නොකළ මෙතුමා මීගමුව නගරයේ මෙන්ම අවට ගම් හා නගර වලටද පාසැල්, විහාරස්ථන , දේවස්ථාන හා වෙනත් ඕනෑම පොදු ස්ථානයන්හිදි සිදු කෙරෙන්නාවූ ඵලදායදී කාර්‍යයන්ට ජාති ආගම් භේදයකින් තොරව සලසාදුන් මහත් සේවාව වෙනුවෙන් ළමුන්ගේ කලා කුසලතාවයන් ඔප්නැංවීමට ජාතික කලාභවන සම්බන්ධ කරගනිමින් චිත්‍ර තරඟ පැවැත්වීම වැනි කාර්‍යයන්ද සිදුකළ මෙතුමාගේ දැනුමින් තම කාර්‍යයන් සපලමත් කරගැනීමට පහත සඳහන් ස්ථානයන්හිදි සේවය සලසා ගන්නා ලදී.

- මීගමුව අගුරුකාරමුල්ල බෞද්ධ සමිතියේ ගරු අනුශාසක
- සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ගේ සංගමයේ ගරු අනුශාසක
- මීගමුව වෙළඳ සංගමයේ ක්‍රියාකාරී සාමාජික
- සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනයේ යාවජීව සාමාජික
- ශ්‍රී ලංකා බෝසත් පදනමේ අනුග්‍රාහක
- මීගමුව බෞද්ධ සදාචාර වර්ධන සමිතියේ අනුශාසක
- මව්බිම ලංකා පදනමේ සූර්යසිංහ නගර නියෝජිත

ඉහත සඳහන් ස්ථානයන්හි කාර්ය මණ්ඩල වල අදහස් සාර්ථක කරවීමට දායක වෙමින් මෙතුමා සතු සහජ ඥානය සමාජයට දායද කර දෙමින් මහගු සේවයක් ඉටු කරනු ලබයි.

මෙතුමාගෙන් සමාජයටද ඉටුවෙන්නාවූ අනුපම සේවයට කෘතවේදය දැක්වීමට හා අගය කිරීමේ අරමුණින් ජාතික සම්මාන උපාධි සරසවි ආයතනයක් පවත්වන ලද සමාජ සේවා සුභසාධක සම්මේලනයේදී වර්ෂ 2005 දී දේශබන්ධු ගෞරව නාමයෙන් පිදුම් ලැබීය.

තවද,

ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය මගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම ව්‍යවසායකින් දීප ව්‍යාප්ත “2006 ජනාධිපති සම්මාන” තරඟාවලියේ සුළු හා මධ්‍යම කර්මාන්ත අංශයේ ආහාර හා නිෂ්පාදන ක්ෂේත්‍රය වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට හැකිවිය.

එම ක්ෂේත්‍රයේම “2006 ජනාධිපති සම්මාන උළෙල” පළාත් මට්ටමින් තෙවන ස්ථානය හිමිකර ගැනීමට හැකිවුයේද “කැල්ටන් ස්විට් හවුස් ප්‍රයිවට් ලිමිටඩ්” ආයතනයටයි.

මීගමුව නගරයට මෙන්ම අවට ගම්වාසීන්ටද මෙතුමාගෙන් ඉටුවෙන්නා වූ අමිල සේවය වෙනුවෙන් මීගමුව නාගරාධිපතිතුමන් වෙතින් පිරිනැමෙන 'මීගමුපුත්‍ර කීර්තිරත්න' ස්වර්ණ ප්‍රණාම 2007 සම්මානයෙන්ද පිදුම් ලබා ඇත.

බුද්ධ ශාසනයට සිදුකර ඇත්තාවූ අනුපම සේවාවටත් ගත කරන්නාවූ ධාර්මික ජීවිතය අගය කිරීමේ අරමුණින් 2008 වර්ෂයේ දී ශ්‍රී ලංකා අමරපුර මහනිකායේ අඹගහපිටිය පාර්ශවයෙන් 'ශාසනාභිවෘධි ධර්මචාරී' ගෞරව නාමයෙන්ද පිදුම් ලැබීය.

2008 වර්ෂයේදී ජාතික සමගි සංගමය විසින් සමස්ත ලංකා මට්ටමින් පිරනමන ලද ගෞරව සම්මාන උළෙලේදී මෙතුමන් දේශමාන්‍ය, දේශාභාමාණි, ලංකාපුත්‍ර, ගෞරව නාමයෙන් පිදුම් ලැබුවේද මීගමුව නගරයට මෙන්ම පොදුවේ වෙනත් ගම් හා නගර වලට ජාති, ආගම් භේදයකින් තොරව සිදුකර ඇත්තාවූ අනුපම සේවාව වෙනුවෙනි.

2008 වර්ෂයේදී ජාතික සම්මාන උපාධි සරසවි ආයතනය මෙහෙයවීමෙන් වීරෝදාර වියතුන්ට ජාතික ගෞරවනාම සම්මාන උපාධි පිරිනමන ලබන අවස්ථාවේදී ශ්‍රී ලංකා ව්‍යාපාර විභූෂණ සමාජ සේවා විශාරද ගෞරව නාමයෙන් පිදුම් ලැබීය.

මෙතුමාගේ මනසේ පහල වූ උදාර සංකල්පය නිසා මේ අයුරින් විවිධ අන්දමින් දියුණුව කරා පියනගන කැල්ටන් සමූහ ව්‍යාපාරය තුල සෘජුව තුන්සියයකට ආසන්න ප්‍රමාණයක් සේවයේ නියලෙන අතර වක්‍රව ඔවුන්ගෙන් යැපෙන්නන් හා සසඳා බැලීමේදී නවසියකට ආසන්න සංඛ්‍යාවකට තම ජීවන ගමන ගෙන යාමට සෙත සැලසී ඇත.